**රාජාංගනය ප්‍රාදේශීය සභාව -2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජාංගනය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජාංගනය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී වැඩ අවසන් කළ මාර්ග ඉදිකිරීම් 04 කට අදාළ අතරඳවා ගැනීම් රු.307,244 ක් ස්ථාවර වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වැඩ අවසන් කළ මාර්ග ඉදිකිරීම්වල අතරුදවුම් ද ඇතුළත්ව වත්කම්වල වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | පූර්ව වර්ෂවල වැඩ අවසන් කර වියදම් සහතික කරන ලද මාර්ග, පාලම් හා බෝක්කුවලට අදාළ අතරුදවුම් රු.34,311,502 ක් නිදහස් කරන තෙක් වත්කම් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා එම වත්කම්වල ක්ෂය රු.3,431,150 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැති බව. | ක්ෂය වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | කලින් ලද ජල ගාස්තු රු.6,400 ක් ජංගම වගකීම් ලෙස නොදක්වා ලැබිය යුතු ජල ගාස්තුවලට හිලව් කර තිබීම නිසා හිඟ ජල ගාස්තු රු.6,400 කින් අඩුවී තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2023 මැයි 12 දිනැති අංක 02/2021(viii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් ලබාගත් මුද්‍රිත පිටපත් අනුව පැමිණි හා පිටවූ වේලාවන් නිවැරදි බවට සනාථ නොකර රු.241,251 ක අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | අත්‍යවශ්‍ය රාජකාරි සඳහා යොදවා ඇති සීමිත පිරිසක් සඳහා පැමිණීම පරීක්ෂා කර බලා අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා ඇති බව. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.8,332,419 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.8,712,211 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජංගම ගිණුම් 02 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.7,822,866 ක් වූ මුදල් නිෂ්කාර්යව පැවති අතර එම මුදල් කෙටිකාලීන ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | මෙම අතිරික්ත මුදල් රාජ්‍ය බැංකු 03 කින් ලබාගෙන ඇති මිල ගණන් අනුව සුදුසු බැංකුව තෝරාගෙන ස්ථාවර තැන්පත්වල තැන්පත් කිරීමට නියමිත බව. | ගිණුම්වල පවතින මුදල් ශේෂ ඵලදායීව භාවිතා කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,146,600 | 2,136,555 | 2,180,555 | 400 | 1,360,500 | 1,534,240 | 973,440 | 44,400 |
| (ii) | කුලී | 15,566,838 | 9,636,323 | 9,508,176 | 5,413,310 | 11,802,082 | 10,058,192 | 9,588,502 | 5,285,163 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 415,250 | 504,225 | 730,650 | - | 318,000 | 423,530 | 335,530 | 226,425 |
| (iv) | වෙනත් ආදායම් | 15,465,500 | 7,959,557 | 11,277,183 | 4,051,778 | 19,163175 | 7,502,844 | 7,130,990 | 7,369,404 |
| | | 32,594,188 | 20,236,660 | 23,696,564 | 9,465,488 | 32,643,757 | 19,518,806 | 18,028,462 | 12,925,392 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශවල පිහිටියා වූ නිශ්චල දේපලක් හෝ නිශ්චල දේපළ වර්ගයක වාර්ෂික වටිනාකම පාදක කරගෙන වරිපනම් බදු පැනවිය යුතු වුවත්, එම ප්‍රදේශ හඳුනාගෙන පනතේ උපදෙස් ප්‍රකාරව වරිපනම් පැනවීමට 2023 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | දේපළ තක්සේරු කිරීමෙන් පසු වරිපනම් පැනවීමට නියමිත බව. | වරිපනම් පැනවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| (i) | කඩ කාමර 60 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අයවිය යුතු රු.3,083,200 කින් සියයට 58 ක් වූ රු.1,778,410 ක් අයකරගෙන නොතිබුණු අතර එම කඩ කාමර වෙනුවෙන් 2023 ජනවාරි 01 දිනට වූ රු.4,780,213 ක හිඟ කුලී වලින් රු.3,330,400 ක්වූ සියයට 69 ක් ද අයකරගෙන නොතිබුණි. | හිඟ කඩ කුලී අයවෙමින් පවතින බව හා අයනොවන කඩ කුලී සම්බන්ධයෙන් සමථ මණ්ඩලයේ නඩු පවරා ඇති බව. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | වාහන කුලී හිඟ රු.163,250 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **වෙනත් ආදායම්**

| | | | |
|---|---|---|---|
| (i) | දැන්වීම් පුවරු වෙනුවෙන් අයවිය යුතු රු.95,725 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,709,500 ක් හා මුද්දර ගාස්තු රු.558,500 ක් ලැබී නොතිබුණි. | මේ වනවිට ඉල්ලීම් කර ඇති බව හා කඩිනමින් ලැබේ යැයි අපේක්ෂිත බව. | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පිළිගන්නා බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සිරිමාපුර අංක 04 දරන කඩ කාමරය 2022 වර්ෂයට පෙර සිට අලුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම නිසා බදු දීමට නොහැකි වීම හේතුවෙන් රු.36,000 ක පමණ පාඩුවක් සභාවට සිදුවී තිබුණි. | පිළිගන්නා බව. | අලුත්වැඩියා කර බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 පෙබරවාරි 18 දින රු.57,000 ක් ගෙවා මිලදී ගෙන තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍රය සඳහා සේවා ගිවිසුමක් ඇතිකර නොගැනීම නිසා එම යන්ත්‍රය 2023 ඔක්තෝබර් 18 දින සිට අක්‍රියවී තිබුණි. එම නිසා රු.53,944 ක් ගෙවා නැවත නව යන්ත්‍රයක් මිලදී ගැනීමට සභාවට සිදුවී තිබුණි. | සේවා සඳහා ගිවිසුම්ගත වීමේදී සහ අලුත්වැඩියා කිරීම් වෙනුවෙන් ද ගෙවීම් කිරීමට සිදුවන බැවින් සේවා ගිවිසුම් ඇතිකරගෙන නොමැති බව. | ආර්ථිකමය වාසි ලැබෙන පරිදි සේවා ගිවිසුම් ඇති කරගෙන තිබිය යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික දේපළ සමීක්ෂණය සහ දූරකථන කුළුණු පිළිබඳ සමීක්ෂණය සිදුනොකිරීම නිසා සභා බල ප්‍රදේශයේ තිබෙන ව්‍යාපාර, කර්මාන්ත සහ වෙළඳ ස්ථාන වෙනුවෙන් අයවිය යුතු ව්‍යාපාර බදු, කර්මාන්ත බදු සහ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීම් නිවැරදි බවට තහවුරු නොවුණි. | පිළිගන්නා බව. | දේපළ සමීක්ෂණය වාර්ෂිකව සිදු කළ යුතුය. |
| (ආ) | බල ප්‍රදේශයේ තිබෙන පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගෙන පරිසර බලපත්‍ර ලබාගැනීම සඳහා අදාළ ආයතනවල හිමිකරුවන් දැනුවත් කිරීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. | -එම- | පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගත යුතුය. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 ඔක්තෝබර් 31 දින පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කරන ලද 2017/02 දරන චක්‍රලේඛයේ 07 ඡේදය අනුව සභා දේපළක් වර්ෂ 03 කට වැඩි කාලයක් සඳහා බදු දෙන්නේ නම් ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගත යුතු වුවත් එම අවසරය ලබානොගෙන සහ ගිවිසුම් කාලසීමාවක් සඳහන් නොකර සභාව විසින් කඩ කාමර බදුදී තිබුණි. | වසර 05 ක් සඳහා කඩ කාමර බදුදී නොමැති අතර වසර 03 කින් පසු ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර ඇති බව. | නව ගිවිසුම් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු 5 කණුව සතිපොළෙහි තිබෙන කුකුල් මස් කඩය සහ පුත්තලම් හන්දිය කුකුල් මස් කඩය 2023 වර්ෂය පුරාම නිෂ්කාර්යව පැවතුණි. | පිළිගන්නා බව. | මෙම දේපළ බදු දීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ධාවනයෙන් ඉවත් කර වර්ෂ 06 ක කාලයක් ගතවී තිබුණු කැබ්රථයක් සහ ධාවනයෙන් ඉවත් කර වර්ෂ 03 ක කාලයක් ගතවී තිබුණු FOTON රථයක් අපහරණය කිරීමට කටයුතු නොකර නිෂ්කාර්යව ගාල්කර තිබුණි. | පිළිගන්නා බව. | අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාවේ අවශ්‍යතාවයකින් තොරව සභාව වෙත ලබාදී තිබුණු කසළ එකතු කරන වාහනය භාවිතයට ගැනීමකින් තොරව සභා භූමියේ ගාල්කර තිබුණි. | බල ප්‍රදේශයේ කසළ එකතු කිරීම සීමිත බැවින් අවශ්‍ය අවස්ථා වලදී පමණක් භාවිතයට ගනු ලබන බව. | භාවිත නොකරන අවස්ථා වලදී කුලියට දී ආදායම් ලබාගැනීමට අවධානය යොමුකළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1. වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර තිබුණු කාර්යයන් 11 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. එම කාර්යයන්ගෙන් 06 ක් සඳහා ඇස්තමේන්තුගත වටිනාකම් සඳහන් කර නොතිබුණු අතර ඉතිරි කාර්යයන් 05 සඳහා රු.810,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණි. | පිළිගන්නා බව. | සැලසුම් කළ පරිදි වැඩසටහන් වර්ෂය තුළදී ක්‍රියාත්මක කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගත යුතු බවට මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2011 නොවැම්බර් 08 දින නිර්දේශ කර තිබුණු නමුත් පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍රය කඩිනමින් ලබාදෙන බවට මධ්‍යම පරිසර අධිකාරිය විසින් දැනුම් දී ඇති බව. | පරිසර බලපත්‍රයක් ලබාගත යුතුය. |